# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2030/46 - 2017 අගෝස්තු මස 04 වැනි සිකුරාදා - 2017.08.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

නියෝග අංක 44

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

20(5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(5) වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම නිෂ්පාදකයකු, ආනයනකරුවකු, බෙදාහරින්නකු හෝ වෙළෙන්දෙකු විසින් පහත දක්වා ඇති සහල් වර්ග පහත සඳහන් උපරිම සිල්ලර මිලට වැඩියෙන් වෙළෙඳාම් කිරීම, වෙළෙඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළෙඳාම් කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙයින් නියෝග කරනු ලැබේ.

| *සහල් වර්ගය* | *දේශීය නිෂ්පාදිත සහල් සඳහා උපරිම සිල්ලර මිල* | *ආනයනික සහල් සඳහා උපරිම සිල්ලර මිල* |
|---|---|---|
| සම්බා සහල් (කීරි සම්බා හා සුදුරු සම්බා හැර) | කිලෝ ග්‍රෑම් 1 ක් රු. 90/- | කිලෝ ග්‍රෑම් 1 ක් රු. 80/- |
| නාඩු සහල් | කිලෝ ග්‍රෑම් 1 ක් රු. 80/- | කිලෝ ග්‍රෑම් 1 ක් රු. 75/- |
| කැකුළු සහල් | කිලෝ ග්‍රෑම් 1 ක් රු. 78/- | කිලෝ ග්‍රෑම් 1 ක් රු. 65/- |

මෙම නියෝගය 2017 අගෝස්තු මස 04 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2017 පෙබරවාරි මස 17 වැනි දින අංක 2006/52 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග අංක 42 මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

හසිත තිලකරත්න,
සභාපති.

2017 අගෝස්තු මස 04 වැනි දින,
කොළඹ දී ය.

08-734


1A - PG 3644 — 207 (2017/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*